# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2259/4 - 2021 දෙසැම්බර් මස 20 වැනි සඳුදා - 2021.12.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය:* 2/2/1/143.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/17/2018/E/404.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ 234, බැණ්ඩියමුල්ල උතුර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි බැණ්ඩියමුල්ල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් වෙනුවෙන් ගම්පහ දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2021.11.19 දිනැතිව පිළියෙල කරන ලද මූලික පිඹුරු අංකය ගම් 4265හි පෙන්නුම් කර ඇති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 0.3280ක් වූ පහත සඳහන් ඉඩම් කොටස:

**01 කැබලි අංකය: 01**

ඉඩමේ නම: අළුබෝගහවත්ත; ඉඩමේ විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් සහ සිමෙන්තියෙන් බඳින ලද ළිඳක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: ප්‍රසන්න ඇතුලත්මුදලි, අංක 194/02, රයියාදොළුව වත්ත. උග්ගල්බොඩ, ගම්පහ (අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා) ; ප්‍රමාණය: හෙක්:0.3280.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ පහත දිනය අනුව පෙරවරු. 10.00ට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

පරීක්ෂණ දිනය

| කැබලි අංකය | දිනය |
|---|---|
| 01 | 2022.01.20 |

තවද 2022 ජනවාරි මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ, ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ප්‍රාදේශීය ලේකම්,
ගම්පහ.

2021 දෙසැම්බර් මස 16 වැනි දින
ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 12 - 0212

1A - G 35616 – 25 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ වූ දැන්වීම් සංශෝධනය

හම්බන්තොට ජල සම්පාදන ක්‍රමයේ වළවේ ගඟ හරහා ලවණ බාධකය ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත්කර ගැනීම

*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය:* DSAM/LAN/08/AQ/26.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* අම්/ඉ/2/7/26.

ඉහත කරුණට අදාළව 2013 නොවැම්බර් මස 29 දිනැති 1835/58 අංක දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* 07 වන වගන්තිය යටතේ, අංක 12-618 යටතේ පළ කරන ලද දැන්වීම කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

ඒ අනුව එම දැන්වීමෙහි උපලේඛනය අ. ග. පි. 466හි අතිරේක අංක 61ට අයත් පත්‍ර අංක 63හි කැබලි අංක 639න් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0130ක් ලෙසද,

*මායිම්* :

*උතුරට* : අ. ග. පි. 466හි කැබලි අංක 128 ද,
*නැගෙනහිරට* : අ. ග. පි. 466හි කැබලි අංක 128 ද,
*දකුණට* : අ. ග. පි. 466හි කැබලි අංක 142 ද,
*බටහිරට* : අ. ග. පි. 466හි කැබලි අංක 142 හා 128 ලෙස ද, සංශෝධනය විය යුතුය.

ඒ අනුව නැවත හිමිකම් පරීක්ෂණ පැවැත්වෙන දිනය 2022.03.15 වැනි දින පෙ. ව. 10.00 ලෙසට සංශෝධනය කළ යුතු බව මෙයින් දැනුම් දෙමි.

එන්. ඩී. පී. රණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
අම්බලන්තොට.

EOG 12 - 0213.